# ඔබව දැනුවත් කිරීම අපගේ යුතුකමකි

WARNA LEGAL විසින් ඔබ වෙනුවෙන් පිදෙන
සමාජ සත්කාර උපදෙස් පිටුවට ඔබගේ ප්‍රශ්ණ යොමු කරන්න

+61 3 9792 9977 info@warnalegal.com

WARNALEGAL
*Justice for all*



## ශ්‍රී ලංකාවේ උප්පැන්න සහතිකය අනුව මාගේ පවුල් නාමය ඉතා දීර්ඝ වන අතර, එය ඕස්ට්‍රේලියාවේදී භාවිතා කිරීම ඉතා අපහසුය. මා හට මාගේ පවුල් නාමය (Family Name) ඉවත් කර ගත හැකිද?

1. මා ඕස්ට්‍රේලියාවේ අවුරුදු අටක ස්ථිර පදිංචිකාරියක වන බැවින් මාගේ අවුරුදු 65 ක් වයසැති වැන්දඹු මව ව ස්ථිර පදිංචිය සඳහා ඕස්ට්‍රේලියාවට ගෙන්වා ගත හැකිද? - මාධවී - Vic, Australia

ඔබ ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිකාරියක වන බැවින් ඔබට මව වෙනුවෙන් දෙමාපිය වීසා අයදුම් කළ හැකිය. මෙහිදී ඕස්ට්‍රේලියානු රජයට අදාළ සුභසාධන ගාස්තු ගෙවීම හෝ නොගෙවීම යන එක් කොටසක් යටතේ අයදුම් කළ හැකි වන අතර, මේ සඳහා ඔබගේ පැරණි පවුලේ සිටින සාමාජික සංඛ්‍යාව,එනම් ඔබගේ මවට සිටින දරුවන් සංඛ්‍යාව සහ ඉන් කොපමණා දෙනෙක් ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටිනවාද යන මූලික කරුණා බලපායි.

2. මා ශ්‍රී ලංකාවේදී 2015 වසරේදී විවාහ වූ අයෙක්මි. මාගේ භාර්යාවගෙන් මා දැන් වෙන්වී වසර එකහමාරකි. මා හට ලංකාවට නොගොස් ඕස්ට්‍රේලියාවේදී දික්කසාදය ලබා ගත හැකිද? - නුවන් - Vic, Australia

ඔබ ඕස්ට්‍රේලියාවේ පදිංචිවීම සහ කසාදයෙන් වෙන්වීම යන ඕස්ට්‍රේලියාවේ පවුල් නීතිය අනුව සුදුසුකම් සපුරා ඇති බැවින් ඕස්ට්‍රේලියාවේ උසාවියකින් දික්කසාදය අයදුම් කළ හැකිය. සාමාන්‍යයෙන් මාස 3 කින් ඔබට දික්කසාදය ලැබෙන අතර, නැවත ඔබට ඕස්ට්‍රේලියාවේදී බාධාවකින් තොරව විවාහ විය හැකිය. ශ්‍රී ලංකාවේදී නැවත විවාහ වන්නේ නම් ඔබේ දික්කසාද සහතිකය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීමෙන් පසුව කළ හැකිය.

3. මාගේ අසල්වැසියා සමග මායිම් වැට සම්බන්ධයෙන් ප්‍රශ්නය කථාබහ කර මෙය විසඳා ගැනීමට උත්සහ දරා ඇතත් ප්‍රතිඵලදායක නොවූ බැවින්, මෙම ගැටලුව විසඳා ගන්නේ කෙසේද? - මැල්කම් - Vic, Australia

මෙම ආරවුල සමථ කර වැට අලුත්වැඩියා කර ගැනීමට සමථ කරුවෙකු ලබා දෙන මෙන් ඔබට මෙවන් ආරවුල් විසඳා දෙන වික්ටෝරියානු රජයේ ආයතනය මඟින් පහසුකම් ලබා ගත හැක.
Dispute Settlement Centre of Victoria Tel : 1300372888

4. මා එංගලන්තයේ ස්ථිර පදිංචි වයස අවුරුදු 28 ක සිසුවෙකි. මා හට ඕස්ට්‍රේලියාවට පැමිණීමට ආශාවක් ඇති බැවින් කුමන වීසාවක් අයදුම් කළ යුතුද? - බ්‍රෙන්ඩන් - England

ඔබට එංගලන්ත ගුවන් ගමන් බලපත්‍රය ඇත්නම්, තාවකාලිකව රැකියාවක් සඳහා ඕස්ට්‍රේලියාවට පැමිණිය හැකි වන අතර, මෙම වීසාව අවශ්‍ය නම් දීර්ඝ කරගත හැකිය. ඊට අමතරව ඔබ අවශ්‍ය නිපුණතා සපුරන්නේ නම්, ස්ථිර පදිංචිය සඳහා වුවද අයදුම් කළ හැකිය.

5. මා ඕස්ට්‍රේලියාවට 2012 වසරේදී බෝට්ටුවෙන් පැමිණියෙමි. දැන් මාගේ සරණාගත වීසා අයදුම්පත ප්‍රතික්ෂේප වී සහ ඊට එරෙහිව මා අයදුම් කළ උසාවි අයදුම්පතද නිශ්ප්‍රභා වී ඇත. නැවත මා ලංකාවට යාමට අදහස් නොකරන අතර මා හට ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය හිමි සහකාරියක ඇති බැවින් විවාහ වී වීසා අයදුම් කළ නොහැකිද? නීල් - Adelaide

සහකාර වීසා (Partner Visa) අයදුම් කිරීමට ඔබ වෙත ඕස්ට්‍රේලියානු රජය විසින් බාධකයන් ඇතුළත් කර ඇති බැවින් ඔබට ඕස්ට්‍රේලියාවේදී මෙම වීසාව අයදුම්කළ නොහැකිය.ඒ සඳහා ඔබ විවාහ වීමෙන් පසුව නැවත ශ්‍රී ලංකාවට යා යුතුය. ඔබට වෙනත් ඕස්ට්‍රේලියානු වීසා අයදුම් කිරීමට වසර 3 ක බාධකයක් ඇති බැවින්, එය ඉවත් කරන මෙන් ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයට කරුණු දක්වා සහකාර වීසාව අයදුම්කළ හැකිය

6. ශ්‍රී ලංකාවේ උප්පැන්න සහතිකය අනුව මාගේ පවුල් නාමය ඉතා දීර්ඝ වන අතර, එය ඕස්ට්‍රේලියාවේදී භාවිතා කිරීම ඉතා අපහසුය. මා හට මාගේ පවුල් නාමය (Family Name) ඉවත් කර ගත හැකිද?- සුරේෂ් - Sydney

ඕස්ට්‍රේලියානු නීතිය යටතේ ඔබට නම් වෙනස් කිරීමක් (Name Change) කරගත හැකිය. නමුත් ඔබ වෙනස් කරන නාමය ඔබේ තිබූ නාමයට සම්පූර්ණා වෙනස් එකක් බවට පත් කරගත නොහැකිය. ඔබේ දීර්ඝ නාමයන් කෙටි කර ගනිමින් ඔබට ඔබේ නම වෙනස් කරගත හැකිය.
උදා: පවුල් නාමය -
දීර්ඝ : කළුකන්කානම්ගේ, කෙටි : කළු

WARNALEGAL
*Justice for all*

නීති උපකාර | சட்ட சேவைகள் | یقفقح تامدخ

Need Legal Help? Call us Now

- FAMILY LAW
- AUSTRALIAN LEGAL ADVICE
- MIGRATION LAW
- SRI LANKAN LEGAL ADVICE
- CONVEYANCING
- COMMERCIAL & BUSINESS LAW
- LITIGATION
- POWERS OF ATTORNEY & WILLS
- ENGLISH/SINHALESE TRANSLATION & INTERPRETING SERVICE
- SRI LANKAN DEEDS AND COMPANY REGISTRATION SERVICE



**Madhu Warnakulasuriya** *LL.B*
*Solicitor and Barrister*
*Registered Migration Agent*
*(MARN 1068979)*
*Attorney at Law in Sri Lanka*

**ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක් සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා අප අමතන්න**

**SWORN TRANSLATIONS • NAATI TRANSLATIONS**

**03 9792 9977**

Australia:
**1/44 King Street**
**Dandenong VIC 3175**

0432 480 133
+61 3 9792 9977
+61 3 9701 3718

info@warnalegal.com
warnalegal1
**www.warnalegal.com**

Sri Lanka:
01 Angampitiya Waikkala Sri Lanka
Hotline – 0776 120 008
031 22 72223 031 22 72223
warnalegal2@gmail.com
warnalegal2